# බන්ධනාගාර මූලස්ථානය

## சிறைச்சாலைத் தலைமையகம்

## PRISON HEADQUARTERS

| දුරකථන<br>தொலைபேசி<br>Telephones | කාර්යාලය<br>அலுவலகம்<br>Office | 2695204<br>4677177 | කොමසාරිස් ජනරාල්<br>ஆணையாளர் நாயகம்<br>Commissioner - General | 2691976 | කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 2694576<br>2695221<br>2692818 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 2695206 |
|---|---|---|---|---|---|---|---|---|

150, බේස්ලයින් පාර,
කොළඹ 09.
150, பேஸ்லைன் வீதி
கொழும்பு 09.
150, Baseline Road,
Colombo-09.


මගේ අංකය / எனது இல. / My No. } බ/12/13/2011

ඔබේ අංකය / உமது இல. / Your No. } ..............................

**දෙපාර්තමේන්තු චක්‍රලේඛණය - 22 /2011**

2011.12.02

සියළුම මාණ්ඩලිකනිළධාරීන්

සියළුම බන්ධනාගාර අධිකාරී / සහකාර අධිකාරීවරුන් වෙත.

**<u>තැන්පත් ගිණුම්වල 2011.12.31 දිනට පවතින ශේෂ ගිණුම් තැබීම.</u>**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන තැන්පත් ගිණුම් කටයුතුවල 2011.12.31දිනට පවත්නා ශේෂ පිළිබඳව විගණකාධිපති වෙත වාර්තා කල යුතුය.

මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් තැන්පත් ගිණුම් පවත්වාගෙන යනු ලබයි.

| | | |
|---|---|---|
| 01.විවිධ තැන්පත් ගිණුම (පැරණි) | 6000/000/00/03/0148 (2011.12.31 දිනටවැසීමට නියමිතය) | |
| 02.විවිධ තැන්පත් ගිණුම (නව) | 6000/000/00/015/0112 | |
| 03.ටෙන්ඩර් තැන්පත් ගිණුම | 6000/000/00/02/017 | |
| 04.සිරකරු වේතන තැන්පත් ගිණුම (පැරණි) | 6000/000/00/03/0149 | ( -එම- ) |
| 05.සිරකරු වේතන තැන්පත් ගිණුම (නව) | 6000/000/00/ 06 /81 | |
| 06.ඇප තැන්පත් ගිණුම | 6000/000/00/01/016 | |

එම තැන්පත් ගිණුම්වල පවතින ශේෂ සම්බන්ධයෙන් පරීක්ෂාකර 2011.12.31 දිනට ප්‍රථම පහත ක්‍රියාමාර්ගය අනුගමනය කරන්න.

01. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ 01/2007 හා 2007.01.04 දිනැති චක්‍රලේඛය අනුව දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබේනම් ආදායම් ශීර්ෂ අංක 2004.10.00 යටතේ රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකල යුතුය. එබැවින් ඒ අනුව කටයුතු කර එම බැරකරන ලද මුදල් පිළිබඳ විස්තරාත්මක ප්‍රකාශයක් සකස්කර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවෙත යැවීමට කටයුතු කරන්න.
02. විවිධ තැන්පත් ගිණුමේ ඇති නිළධාරීන්ගේ ඇප මුදල් ඔහුගේ නමින් ඇප ගිණුම් ආරම්භකර එම ගිණුම්වලට බැර කරන්න.
03. සිර වේතන හා පුද්ගලික තැන්පත් ගිණුමේ ඇති මුදලින් සිරකරු මුදාහරිනු ලැබූ දිනයේ සිට වර්ෂයකට නොඅඩු කාලයක් තුල හිමිකම් පානු නොලැබ ඇති මුදල් සිරකරු සුබ සාධක අරමුදලට බැර කරන්න.
04. තැන්පත් ගිණුම්වල රඳවාගෙන ඇති වැට් බදු, රඳවා ගැනීම් බදු, මුද්දර ගාස්තු හා වෙනත් බදු මුදල් වේ නම් එම මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත නොපමාව යැවීමට කටයුතු කරන්න
05. ඉදිකිරීම්වලට අදාලව රඳවාගත් මුදල් තැන්පත් ගිණුමේ තිබේනම් එම මුදල් සම්බන්ධයෙන් මූලස්ථානයේ සිවිල් ඉංජිනේරු වෙතින් විමසා අනුමැතිය ලබාගෙන අදාල පාර්ශව වෙත ගෙවීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ ඉදිරිකටයුතු කිරීමට ක්‍රියාකරන්න.

06. මුදල් රෙගුලාසි 571 අනුව කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතුකර වර්ෂ දෙකක් ඉක්මවූ හිමිකම් නොපාන ලද තැන්පත් රජයේ ආදායමට බැර කරන්න.

ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් පසුව 2011.12.31 දිනට තැන්පත් ගිණුම්වල සෝවල ශේෂවල ලැයිස්තු වෙන වෙනම සකස්කර 2012.01.31 දිනට ප්‍රථම පහත ආකෘතිය අනුව කාලවිශ්ලේෂණයද සමග බන්ධනාගාර කොමසාරිස් (මුදල්)වෙත ඉදිරිපත් කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩිමනත් තොරතුරු අවශ්‍යනම් නියෝජ්‍ය කොමසාරිස්(මුදල්) ගෙන් ලබාගන්න.

### 2011.12.31 දිනට කාලවිශ්ලේෂණය.

| තැන්පත් ගිණුම | වර්ෂ 2ට අඩු | වර්ෂ 2-5 අතර | වර්ෂ 5ට වැඩි | 2011.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| විවිධ තැන්පත් (පැරනි) 6000/000/00/03/0148 | | | | |
| විවිධ තැන්පත් (නව) 6000/000/00/015/0112 | | | | |
| සිරකරු වේතන තැන්පත් ගිණුම 6000/000/00/03/0149 (පැරණි) | | | | |
| සිරකරු වේතන තැන්පත් ගිණුම 6000/000/00/06/81 (නව) | | | | |
| ඇප තැන්පත් ගිණුම 6000/000/00/01/016 | | | | |
| ටෙන්ඩර් තැන්පත් ගිණුම 6000/000/00/02/017 | | | | |

පී.ඩබ්ලිව් කොඩිප්පිලි.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.

පිටපත - ලේකම්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.

පී.ඩබ්ලිව්. කොඩිප්පිලි
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.